ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2513/31 - 2026 නොවැම්බර් මස 05 වැනි බ්‍රහස්පතින්දා - 2026.11.05

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

රජයේ නිවේදන

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත

25අ වගන්තිය සමග කියවිය යුතු 27(1)(ආ) වගන්තිය යටතේ වන නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25අ වගන්තිය සමග කියවිය යුතු 27(1)(ආ) වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍ය ආචාර්ය හරිනි අමරසූරිය වන මා විසින්, 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාවේ සංස්ථාගත කර ඇති, ලියාපදිංචි අංක පී. වී. 17745 දරන සහ මිලේනියම් ඩ්‍රයිව්, අයි. ටී. පාර්ක්, මාලබේ යන ලිපිනයෙහි පිහිටා ඇති උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් ලෙස පිළිගනු ලබන "සිනෙක් කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ්" ආයතනය සම්බන්ධයෙන් එකී පනතේ 70ඇ වගන්තිය යටතේ වාර්තාවක් ලබා ගැනීමෙන් පසුව, මෙම නියමය මගින්, එකී පනත යටතේ සාදන ලද සහ 2025 ජූනි මස 18 දින අංක 2441/15 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමයේ II වන උපලේඛනයේ, එහි I වන තීරයේ දැක්වෙන "ජාල ආරක්ෂාව සහ වෝහාරික විද්‍යාව පිළිබඳ පරිගණකවිද්‍යා විද්‍යාවේදී ගෞරව උපාධිය" යන සටහනට හා එහි II වන තීරයේ අනුරූප සටහනේ කෙටි යෙදුමට ඉක්බිතිව ම, මෙහි II වන උපලේඛනයේ පිළිවෙලින් I වන සහ II වන තීරයන්හි නිශ්චිතව දක්වා ඇති සටහන් එකතු කිරීම මගින් සහ මෙහි I වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති කොන්දේසිවලට යටත්ව, මෙයින් සංශෝධනය කරනු ලැබේ.

I වන උපලේඛනය

කොන්දේසි

1. සිනෙක් කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය විසින් මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති උපාධි පාඨමාලාව සඳහා සිසුන් ඇතුළත් කර ගැනීමේ දී, නාවික ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය (එස්. එල්. කියූ. එෆ්. 5 වන ස්ථරය) සම්බන්ධයෙන්;

   (අ) ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී සංයුක්ත ගණිතය, භෞතික විද්‍යාව සහ රසායන විද්‍යාව යන විෂයයන් සඳහා අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථ (එස්) තුනක් (03) ක් එකවර ලබා තිබීම හෝ ඒ හා සමාන සුදුසුකමක් ලබා තිබීම; සහ

(ආ) ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී, ඉංග්‍රීසි විෂය සඳහා අවම වශයෙන් සම්මාන සාමාර්ථයක් (සී) ලබා තිබීම හෝ ඒ හා සමාන සුදුසුකමක් ලබා තිබීම.

යන අවම ඇතුළත්කර ගැනීමේ සුදුසුකම්වලට අනුකූලව කටයුතු කළ යුතුය.

2. නිශ්චිත බලධරයා විසින් පවත්වනු ලබන පස් අවුරුදු (5) සමාලෝචනයට යටත්ව මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති උපාධිය පිරිනැමීම සඳහා සිනෙක් කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය පිළිගනු ලැබිය යුතුය.

3. සිනෙක් කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති උපාධිය සඳහා, මෙම නියමය පළ කරන ලද දිනයේ සිට වසරක් ඇතුළත සිසුන් ඇතුළත් කර ගත යුතුය.

II වන උපලේඛනය

I වන තීරය *උපාධිය*	*II වන තීරය* *උපාධිය සඳහා වන කෙටි යෙදුම*
නාවික ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය	බීඑස්සී (නාවික ඉංජිනේරු විද්‍යාව)

ආචාර්ය **හරිනි අමරසූරිය**,
අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ
වෘත්තීය අධ්‍යාපන අමාත්‍ය.

2026 ඔක්තෝබර් මස 26 වැනි දින,
කොළඹ දී ය.

EOG 11 - 0034